# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2018/2019

## සංගීත පීඨය

## සංගීත පරිණාමය - I

## MUML 21023

කාලය :- පැ 03

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න අටකින් (08) සමන්විත වේ.
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කරන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ. (ලකුණු 15)

---

### I කොටස

1. තැන්පත් ඥාණය, ස්මරණය, නැවත ඉදිරිපත් කිරීම, ධ්වනි විශේෂතා හඳුනා ගැනීම, මානව චිත්තවෙගි උපයුක්තවූ ආකාරය සංගීත පරිණාමය ආශ්‍රිතයෙහි විස්තර කරන්න.

(ලකුණු 15)

2. "අදහස් ප්‍රකාශනය" – "ගායනය භාෂාවට වඩා පැරණි බව" – "මානව චර්යාව සහ සමාජ ජීවිතය" – "තාර්කික ඥාණය" යන මේ ශීර්ෂ සංගීත පරිණාමයට අදාළව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

3. සංගීත පරිණාමයෙහි පොදු අර්ථය පිළිබඳ විවරණයක් කරන්න.

(ලකුණු 15)

4. "සංගීත පරිණාමය" යනු "සංගීත ඉතිහාසය" අධ්‍යයන කිරීම කෙරෙහි උපයෝගී කරගත හැකි වෙසෙස් විෂය ක්ෂේත්‍රයකි. විමසන්න.

(ලකුණු 15)

### II කොටස

05. i. සංගීත ඉතිහාසය අධ්‍යයනයේ දී ඉවහල් වන සාහිත්‍යමය මූලාශ්‍රය හයක් නම් කරන්න. (ලකුණු 03)

ii. 'පුරාතන යුගයෙහි ලක්දිව සංගීතයෙහි විශේෂතා' යන මැයෙන් රචනාවක් ලියන්න. (ලකුණු 12)

06. i. ලක්දිව මධ්‍යතන යුගයට අයත් වන රාජ්‍යකාල අනුපිළිවෙලින් නම් කරන්න. (ලකුණු 04)

ii පොළොන්නරු කාලයෙහි රචනා වූවා යැයි සැලකෙන කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 01)

iii. ලක්දිව සංගීතයෙහි ප්‍රවණතා පහක් 'පොළොන්නරුව යුගය' ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

අ.පි.බ

07. i. සංගීත අධ්‍යාපනයෙහි සන්ධිස්ථාන 02 ක් විස්තර කරන්න. (ලකුණු 08)

ii අ.පො.ස (සා.පෙළ) සෞන්දර්ය විෂයයන්ට අදාළ 2010 වසරේ දත්ත කිහිපයක් පහත වගුවෙන් දැක්වෙයි. ඒ පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න. (ලකුණු 07)

| | **විෂයය** | **පෙනී සිටි අපේක්ෂකයින් ගණන** | **ප්‍රතිශතය %** |
|---|---|---|---|
| 1. | සංගීතය (පෙරදිග) | 29,685 | 13.08 |
| 2. | සංගීතය (බටහිර) | 1,480 | 0.65 |
| 3. | සංගීතය (කර්ණාටක) | 8,966 | 3.95 |
| 4. | චිත්‍ර | 120,638 | 53.17 |
| 5. | නැටුම් (දේශීය) | 41,227 | 18.17 |
| 6. | නැටුම් (භරත) | 1,826 | 0.80 |
| 7. | නාට්‍ය හා රංගකලාව (සිංහල) | 18,639 | 8.21 |
| 8. | නාට්‍ය හා රංගකලාව (දෙමළ) | 4,410 | 1.94 |
| | **එකතුව** | **226,871** | **100%** |

08. i. තෝරාගත් එක් සාහිත්‍යමය මූලාශ්‍රයක ඇතුළත් 'සංගීත ඉතිහාසය අධ්‍යයනයට' වැදගත් වන්නා වූ කරුණු 03 නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 09)

ii. සංගීත පරිණාමය අධ්‍යයනයට 'පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය' වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

::::::::::::::::::::::::::::::::::

**2021.11.13**